# ජීවන නිපුණතා

# හා

# පුරවැසි අධ්‍යාපනය

## 6 වන ශ්‍රේණිය

## විෂය නිර්දේශය

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකා

2007

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

<u>පටුන</u>


| | පිටුඅංකය |
|---|---|
| 1.0 හැඳින්වීම | 02 |
| 2.0 ප්‍රධාන නිපුණතා | 03 |
| 3.0 6 වන ශ්‍රේණියට අදාළ අනු නිපුණතා | 04 |
| 4.0 ඉගනුම් ඉගැන්වීම් ක්‍රමවේද | 05 |
| 5.0 තක්සේරු කරණය හා ඇගයීම | 08 |
| 6.0 පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන් | 10 |
| 7.0 යෝජිත කාලච්ඡේද | 12 |
| 8.0 විෂයය නිර්දේශය | |
| 8.1 ජීවන නිපුණතා | 13 - 21 |
| 8.2 පුරවැසි අධ්‍යාපනය | 22 - 27 |


Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 1.0 හැඳින්වීම

ජීවන නිපුණතා විෂයය 1999 වර්ෂයේ මුලින්ම ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතියට හඳුන්වා දෙන ලදි. එමගින් අපේක්ෂා කලේ සිසුන් එදිනෙදා ජීවිතයේ දී මුහුණ දෙන ගැටලු, අභියෝගවලට, සාර්ථකව මුහුණදිය හැකි, වත්මන් ලෝකය තුළ සාර්ථකව ජීවත්වීමට අවශ්‍ය මනෝ සමාජීය වශයෙන් ශක්තිමත් පෞරුෂයකින් හෙබි සිසු පිරිසක් බිහිකිරීමේ අපේක්ෂාවෙනි. එවැනි විශිෂ්ට වූ අපේක්ෂාවන් පැවතිය ද එය ක්‍රියාත්මක තලය තුළ අපේක්ෂිත අරමුණු කරා ළඟා වීමට යම් යම් බාධා වලට මුහුණදීමට සිදුවිය. එය එසේ වුවද මෙය වර්තමාන සමාජයට අවශ්‍ය අනිවාර්යය අංශයක් වී ඇති බැවින් නව මුහුණුවරකින් ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය නමින් නව විෂයයක් 6 වන ශ්‍රේණියේ සිට 9 වන ශ්‍රේණිය දක්වා හඳුන්වාදීමට නියමිත ය. එසේම විෂය තවදුරටත් පුළුල් වෙමින් 10 හා 11වන ශ්‍රේණි සඳහා පුරවැසි අධ්‍යාපනය හා පාලනය ලෙස යොමුවීමට යෝජිතය. 2007 දී 6 වන ශ්‍රේණිය සඳහා ප්‍රථමවරට මෙම විෂය හඳුන්වා දීමට යෝජිත ය.

නව නිර්දේශයේ සැකැස්ම ප්‍රධාන ක්ෂේත්‍ර දෙකකින් සමන්විත ය. ජීවන නිපුණතා ක්ෂේත්‍රයට අදාළ විෂය අන්තර්ගතයන් ද, පුරවැසි අධ්‍යාපනයට අදාළ අන්තර්ගතයන්ගෙන් යුක්ත වේ. ජීවන නිපුණතා විෂයයේ තේමා පුද්ගලයාගේ පෞරුෂ සංවර්ධනයට මෙන්ම සමාජ සංවර්ධනයට අදාලවන ආකාරයට යොමුවී ඇත. සිසුන් තුළ සමබර පෞරුෂ සංවර්ධනයක් ඇති කිරීම මෙමගින් අපේක්ෂා කරන අතර එමගින් එදිනෙදා ජීවන අභියෝගවලට සාර්ථකව මුහුණදිය හැකි සිසු පරපුරක් බිහිකිරීම අපේක්ෂිත ය. එසේම නවීකරණය වූ වෘත්තීය ලෝකය තුළ නොසැලී ඉදිරියට යාමට අවශ්‍ය ශක්තීන් ලබාදීමත් මෙමගින් බලාපොරොත්තු වේ. 6 වන ශ්‍රේණියේ ජීවන නිපුණතා විෂයයේ තේමා ලෙස ආත්මාවබෝධය, මනා සැලසුමකින් හා සංවිධානාත්මකව කටයුතු කිරීම, ඵලදායි සන්නිවේදනය, සහානුභූතියෙන් කටයුතු කිරීම යන අංශ කෙරෙහි ද, 6 වන ශ්‍රේණිය පුරවැසි අධ්‍යාපනයේ තේමා ලෙස අපේ පාසල, අප ජීවත්වන ප්‍රදේශය, යහපත් පුරවැසියකු වශයෙන් ප්‍රගුණ කළ යුතු ගුණාංග පිළිබඳව ද විශේෂ අවධානයක් යොමු කොට ඇත. ඒ අනුව ශිෂ්‍යයින් තමා පිළිබඳව ස්වයං අධ්‍යයනයක යෙදී පුද්ගලයින් වශයෙන් තනිව සංවර්ධන වී සමාජ ක්‍රියාකාරිත්වයට සක්‍රියව දායකත්වයක් ලබා දෙමින් ,යහපත් සමාජගත පුරවැසියකු ලෙස ජීවත්වීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපන විෂය නිර්දේශයෙන් අපේක්ෂා කෙරේ.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 2.0 ප්‍රධාන නිපුණතා (ජීවන නිපුණතා ) 1 කොටස

- ★ ආත්මාවබෝධයෙන් කටයුතු කරයි.
- ★ මනා සැලසුමකින් හා සංවිධානාත්මකව කටයුතු කරයි.
- ★ චිත්තවේගවලට සාර්ථකව මුහුණ දෙයි.
- ★ සහනුභූතියෙන් යුතුව කටයුතු කරයි. (සහකම්පනය/ අනුවේදනය)
- ★ සාර්ධර්මානුකූලව හැසිරෙයි.
- ★ ඵලදායි සන්නිවේදනයෙහි යෙදෙයි.
- ★ විවිධත්වය තුළ සාර්ථකව කටයුතු කරයි.
- ★ ධනාත්මක ආකල්ප වලින් යුතුව කටයුතු කරයි.
- ★ ජීවන අවස්ථා හා සන්සිද්ධීන් විචාරශීලීව විශ්ලේෂණය කරයි.
- ★ ජීවන අවස්ථා හා සන්සිදි වලදි නිර්මාණශීලව කටයුතු කරයි.
- ★ යහපත් අන්තර්පුද්ගල සම්බන්ධතා ප්‍රදර්ශනය කරයි.
- ★ නායකත්වයට ගරුකරමින් නායකත්ව ගුණාංග ප්‍රගුණ කරයි.
- ★ ඵලදායිව සහ නිර්මාණශීලීව ගැටළු විසදයි.
- ★ ඵලදායි තීරණ ගනියි.
- ★ ආපදා කළමනාකරණයට සක්‍රියව දායක වෙයි.
- ★ ගැටුම් සාමකාමීව විසඳා ගනියි.
- ★ වැඩ ලෝකයට අනුගත වෙයි.

## 2.0 විෂයයට අදාල නිපුණතා

- බහුවිධ සමාජය තුළ එක්සත් බවින් යුක්තව ජීවත් වෙයි.
- මානව ගුණාංග හා සමාජ සාරධර්ම රැක ගනියි.
- විනය ගරුක හා නීති ගරුක පුරවැසියෙකු ලෙස සමාජයේ හැසිරෙයි.
- පුද්ගල හා සමාජීය ක්‍රියාකාරකම් වල ද අන්‍යොන්‍ය සහයෝගයෙන් කටයුතු කරයි.
- ශ්‍රී ලංකාවේ හා ලෝකයේ පාලන රටාවන් විස්තර කරයි.
- ප්‍රජාතන්ත්‍රවාදී මූල ධර්මවලට අනුගතව කටයුතු කරන සමාජයක් ගොඩ නැගීමට දායක වෙයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 3.0 6 වන ශ්‍රේණියට අදාළ අනු නිපුණතා (1 කොටස)

1. ආත්මාවබෝධයෙන් කටයුතු කරයි.
    - 1.1 තමා පිළිබඳ තොරතුරුවල අවශ්‍යතාව සහ ඒවායේ වැදගත් කම අධ්‍යයනය කරයි.
    - 1.2 ජීවිතය හා පසුබිම පිළිබඳ තොරතුරු ගවේෂණය කරයි.
    - 1.3 තමාගේ හා අන්අයගේ වටිනාකම් හඳුනාගෙන ඒවාට ගරු කරමින් සහයෝගයෙන් කටයුතු කරයි.

2. මනා සැලසුමකින් හා සංවිධානාත්මකව කටයුතු කරයි.
    - 2.1 ජීවිතයට අදාළ කටයුතු මනා සැලසුමකින් හා සංවිධානාත්මකව ඉටු කරයි.
    - 2.2 ඵලදායි ලෙස විවේකය ගතකරයි.

3. ඵලදායි සන්නිවේදනයෙහි යෙදෙයි.
    - 3.1 සක්‍රිය සවන්දීම හා නිවරදිව අදහස් ප්‍රකාශ කිරීමේ යෙදෙයි.
    - 3.2 ඵලදායි සන්නිවේදනය මගින් යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා ගොඩනගා ගනියි.

4. සහානුභූතියෙන් යුතුව කටයුතු කරයි.(සහකම්පනය / අනුවේදනය)
    - 4.1 අන්‍යයන්ගේ අවශ්‍යතා තමාගේ අවශ්‍යතාවක් ලෙස දැක යහපත් ප්‍රතිචාර දක්වයි.
    - 4.2 පරිසරය හා සංස්කෘතික උරුම සුරැකීමට පෙළඹෙයි.
    - 4.3 අධිසංවේදී නොවී කාර්යයන්හි නිරතවෙයි.

## 6 වන ශ්‍රේණියට අදාළ අනු නිපුණතා (II කොටස)

- ක්‍රියාශීලී සාමාජිකයෙකු වශයෙන් පාසල් සමාජයේ සංවර්ධනයට දායක වෙයි.
- ප්‍රදේශයේ මානව හා භෞතික සම්පත් සමාජයේ යහපැවැත්මට දායක කර ගනියි.
- යහපත් ගුණාංග වලින් හෙබි සාමාජිකයකු ලෙස ජන සමාජය තුළ කටයුතු කිරීමට සූදානම ප්‍රදර්ශනය කරයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 4.0 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද (ජීවන නිපුණතා)

ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය විෂය නිර්දේශ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය මෙහෙයවීමේ දී, ගුරුවරයා විසින් ඉගැන්වීමට වඩා සිසුන්ට ඉගෙනීමට අවස්ථාවන් සලසාදීම වැදගත් වේ. මෙම විෂයය මගින් අපේක්ෂා කරන ආකාරයට පුද්ගල සංවර්ධනය මගින් සමාජ සංවර්ධනයට දායකත්වය ලබාදීමට දරුදැරියන් තුළ නිපුණතා සංවර්ධනය කළයුතු බැවින් එකී හැකියා වර්ධනයට ඉගෙනුම් ඉගැන්වීම් පරිසරයක් නිර්මාණය අතිශයින් වැදගත් වේ.

නව විෂය ක්ෂේත්‍රය තුළ ඉගෙනුම් ඉගැන්වීම් උපාය මාර්ග වඩාත් නම්‍යශීලී විය යුතු අතර දේශන හා සාකච්ඡා වලට වඩා ව්‍යවහාරික සමාජයට වඩාත් උචිත සජීවී ජීවන අත්දැකීම් ලබාදීම යෝග්‍ය වේ. විශේෂයෙන් සහයෝගී කණ්ඩායම් ක්‍රම මගින් ඉගැනුම් අත්දැකීම් ලබාදීම මගින් දරුදැරියන් තුළ සමාජශීලී කුසලතා වර්ධන කිරීම අපේක්ෂිතයි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී පංතිකාමරය, පාසල් සමාජය, පාසල් පරිසරය, අවට පරිසරය, හා අවට සමාජ ආයතන සජීවී ඉගෙනුම් අත්දැකීම් ලබාගැනීම සඳහා යොදා ගත හැකි ය.

මෙවැනි ඉගෙනුම් ඉගැන්වීම් පරිසර තුළදී නිරීක්ෂණ, සිද්ධි අධ්‍යයන , ක්‍රීඩා, භූමිකා රංගන, සම්මුඛ සාකච්ඡා, සමීක්ෂණ ගවේෂණ, ස්වයං අධ්‍යයන, අත්හදා බැලීම්, බුද්ධි කලම්බන සාකච්ඡා, ප්‍රදර්ශන, ව්‍යාපෘති , ක්ෂේත්‍ර අධ්‍යයන , වැනි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම ගුරුවරයාට අභිමත පරිදි යොදා ගත හැකි ය.

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේද (පුරවැසි අධ්‍යාපනය)

දීර්ඝ කාලයක් තිස්සේ පන්ති කාමර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ ප්‍රමුඛ ස්ථානයක් ගත් දේශන ක්‍රමය තවදුරටත් වැදගත් ඉගැන්වීමේ උපාය මාර්ගයක් වශයෙන් පවත්වා ගෙන යාම මෙහි දී අවධාරණය නොකෙරේ. ශිෂ්‍යශිෂ්‍යාවන් තරගකාරී අධ්‍යාපනික පරිසරයක් කරා මෙහෙයවනු වෙනුවට සාමූහිකත්වය හා වැඩ ලෝකයට අදාළ නිපුණතා වර්ධනය කරන ප්‍රීතිදායක ඉගෙනුම් පරිසරයක් ඇති කරන සවයං අධ්‍යයනයට පොළඹ වන ඉගෙනුම් ක්‍රමවේද කෙරෙහි අපගේ අවධානය යොමු විය යුතු ය.

පුරවැසි අධ්‍යාපනය විෂයයෙන් අවසන් වශයෙන් අපේක්ෂා කෙරෙන්නේ මිනිස් ගුණ ධර්මවලින් හෙබි, සාමකාමී සහජීවනයෙන් යුත් අනාගත පරපුරක් බිහි කිරීම ය. මේ අරමුණ මුදුන්පත් කර ගැනීම සඳහා ශිෂ්‍යයාට පංතිකාමරයේ උගත් කරුණු ජීවිත අත්දැකීම්වලට සම්බන්ධ කරගැනීමට අවස්ථා ලබාදිය යුතු අතර ඒ සඳහා ප්‍රායෝගික ක්‍රියාකාරකම් අත්‍යවශ්‍ය වෙයි. එබැවින් විෂය කරුණු ඉගැන්වීමට වඩා ප්‍රායෝගික අත්දැකීම් පෙරදැරි කර ගෙන ඉගෙනුම් - ඉගැන්වීම් හා ඇගයීම යන ස්වාධීන පංති කාමර ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතු ය. පාසලෙන් බාහිර ආයතන හා පුද්ගලයින් සමඟ සබඳතා පවත්වා ගැනීමෙන් සිසුන්ගේ

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

සමාජමය කුසලතා වර්ධනය වේ. ප්‍රජාතන්ත්‍රවාදී අගයන් හා සම්බන්ධ චර්යාමය රටා වර්ධනය වන ආකාරයේ ඉගෙනුම් සිද්ධි මගින් අත්දැකීම් වර්ධනය කිරීම පිණිස පන්ති කාමරයෙන් බැහැර ක්‍රියාකාරකම්වලට සිසුන් යොමු කිරීමත් එම ක්‍රියාකාරකම් ශිෂ්‍යයාගේ වයස් මට්ටමට ගැලපෙන පරිදි සංවිධානය කිරීමත් සඳහා ගුරු භවතුන් විසින් මනා සැලැස්මක් සකස් කර ගැනීම කළ යුතුය.

කරුණු ඉගැන්වීමට වඩා ස්වයං අධ්‍යයනයට, නිරීක්ෂණයට, තොරතුරු රැස් කිරීමට හා ඒවා විශ්ලේෂණය කිරීමට, කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත වීමට,සහ ශිෂ්‍ය පෞරුෂ වර්ධනයට අදාළ වන නායකත්වයට ගරු කිරීම, නායකත්වය ඉසිලීම, අන්‍ය මත ඉවසීම, විනීත හා විනයගරුක ව

හැසිරීම පිළිබඳ ගතිලක්ෂණ ශිෂ්‍යයයින් තුළ වර්ධනය කිරීම සඳහා ප්‍රායෝගික ක්‍රියාකාරකම් වැදගත් වෙයි. ඒ සඳහා පංති කාමරය තුළ දී හා ඉන් පිටත දී ගුරු මඟ පෙන්වීම වැදගත් වේ. පහත දැක්වෙන ඉගෙනුම් ක්‍රමවේද පුරවැසි අධ්‍යාපනය විෂයය ඉගැන්වීම සඳහා යෝජනා කරනු ලැබේ. ඒ පිළිබඳ වැඩිදුර තොරතුරු ගුරු අත්පොත් හා සේවාස්ථ පුහුණු කාර්ය සැසි ඇසුරෙන් ලබා ගැනීම මැනවි.

- නිරීක්ෂණය
- ගවේෂණය
- සම්මුඛ සාකච්ඡා මගින් තොරතුරු රැස් කිරීම
- තොරතුරු විශ්ලේෂණය කිරීම
- ක්ෂේත්‍ර වැඩ
- ළමා පාර්ලිමේන්තුව, සුභ සාධක සමිති සමාගම්, ශ්‍රමදාන හා ශ්‍රමාභිමානී කඳවුරු, ශිෂ්‍යභට හා බාල දක්ෂ කඳවුරු
- ගිලානෝපස්ථාන හා ආපදා කළමනාකරණය
- විවිධ සමිති සමාගම්; සමාජ සුභ සාධන, පරිසර සුරැකීම, පෞරාණික සම්පත් සුරැකීම.
- ව්‍යාපෘති
- ගැටලු විසඳීමේ ක්‍රමය
- විමසුම් ඉගැන්වීමේ ක්‍රමය
- ප්‍රශ්නෝත්තර ක්‍රමය
- බිත්ති පුවත්පත්
- ප්‍රදර්ශන

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

පන්ති කාමරය තුළ සිදු කෙරෙන ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා ඉහත දැක්වූ ඉගෙනුම් ක්‍රමවේද අවස්ථාවට ගැලපෙන පරිදි යොදා ගැනීමට ගුරු මහත්ම මහත්මීන්ට නිදහස ඇත.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 5.0 තක්සේරුකරණය හා ඇගයීම (ජීවන නිපුණතා)

### 1. ස්වයං තක්සේරුව

පාඩමට අදාලව නිපුණතා පදනම් කරගෙන ස්වයං තක්සේරු කරණයක් සැලසුම් කිරීම. අදාල පාඩම ඉගැන්වීමට ප්‍රථම සිසුන් ඒ පිළිබඳ ව දක්වන මත, අදහස්, ආකල්ප, පාඩම හෝ වාරය අවසානයේ සිසුන් අදාළ තේමාවන් පිළිබඳ ව දක්වන අදහස් ආකල්ප සංසන්දනාත්මකව තක්සේරු කළ හැකි ය. තම ප්‍රබලතා හා දුබලතා මෙකී ස්වයං තක්සේරුවෙන් අවබෝධ කර ගැනීම අපේක්ෂා කෙරේ. අදාළ නිර්නායක පාසලේ ඇති මානව හා භෞතික සම්පත් ද අවධානයට යොමු කරමින් ගුරුවරයාගේ අභිමතය පරිදි තක්සේරු කරනය හා ඇගයීම සඳහා අදාළ නිර්නායක හඳුනාගත හැකි ය.

### 2. සම වයස් ඇගයීම

යම් කාර්යක් එක් එක් කණ්ඩායමකට පවරා අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට සිසුන් දක්වන(දායකත්වය, සංවිධානය, අන්තර් පුද්ගල සම්බන්ධතා, සැලසුම් කිරීම ආදී) විවිධ නිර්නායක පදනම් කරගෙන ඇගයීම් කටයුතු කළ හැකි ය. කාර්ය අවසානයේ අදාල කණ්ඩායම් වලට උපස්ථම්භනයට ඇගයීම , ත්‍යාග, ආදිය පිරිනැමීම වැදගත් වේ.

### 3. කාර්ය සාධන ගොනු පවත්වා ගෙන යාම

- වාරය ආරම්භයේ දී කාර්ය සාධන ගොනු සැකසීම පිළිබඳ අවශ්‍ය උපදෙස් ලබාදීම.
- වාරය මැදදී අදාල කාර්යය පරීක්ෂා කර ප්‍රතිපෝෂණ ලබාදීම.
- අවසාන ඇගයීම සඳහා පහත සඳහන් නිර්ණායක භාවිතා කිරීම යෝග්‍ය වේ.
- උපදෙස් පිළි පැදීම,
- සංවිධානාත්මක බව,
- නිර්මාණශීලීත්වය,
- අදාළ සංකල්ප, නිපුණතා, අවබෝධ කරගෙන ඇත්ද යන්න අවසාන වශයෙන් ප්‍රදර්ශනය වේද යන්න නිගමනය කිරීම.

### 4. ව්‍යාපෘති ඇගයීම

- වාරයක් අවසානයේ කුඩා ව්‍යාපෘතියක් , කේවල හෝ කණ්ඩායම් වශයෙන් ක්‍රියාත්මක කිරීම. මේ සඳහා නිර්ණායක අභිමත පරිදි සැකසිය හැකි වේ.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 5. විධිමත් ඇගයීම

ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය අදාල මූලික සංකල්ප , අදහස් ප්‍රශ්න විචාරය මගින් පරීක්ෂා කිරීම කළ යුතු ය. මේ ප්‍රශ්න දැනුම, ආකල්ප, කුසලතා, භාවිතයන් හා සම්බන්ධව සැකසීම වැදගත් වේ. මෙය පාඩමක් හෝ වාරයක් අවසානයේ සංවිධානය කළ හැකි ය.

**තක්සේරු කරණය හා ඇගයීම (පුරවැසි අධ්‍යාපනය)**

තක්සේරු කිරීම හා ඇගයීම් පිළිවෙත පහත දැක්වෙන ආකාරයට සිදු විය යුතු වෙයි.

විෂය භාර ගුරු මහත්ම මහත්මීන් විසින් පාසල පදනම් කරගත් ඇගයීම් කාර්යය සංවිධානය කිරීම මැනවි. ජාතික අධ්‍යාපන ආයතනය විසින් සකසන ලද පාසල පදනම් කරගත් ඇගයීම් පටිපාටියට අනුව ඇගයීම් කටයුතු සංවිධානය කිරීම අපේක්ෂා කෙරේ.

පාසල් මට්ටමින්, කලාප මට්ටමින්, පළාත් මට්ටමින්, පැවැත්වෙන මධ්‍ය වාර්ෂික හා වර්ෂ අවසාන පරීක්ෂණයට සිසුන් ඉදිරිපත් කොට ඔවුන්ගේ දැනුම, අවබෝධය, භාවිතය හා ඉහළ මට්ටම්වල ඉගෙනුම් හැකියා මැන බැලීමට පුළුවන.

එක් එක් ඒකකයට නියමිත කාල පරිච්ඡේද සංඛ්‍යාවෙන් 50% පමණ පාසල පදනම් කරගත් ඇගයීම් වැඩ පිළිවෙළ ආශ්‍රිත ව ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා යොදා ගැනීම සුදුසු ය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 6.0 පාසල් ප්‍රතිපත්ති හා පාසල් වැඩ සටහන් (ජීවන නිපුණතා)

ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය විෂය පාසල තුළ ක්‍රියාත්මක කිරීමේ දී එය පන්ති කාමරයට සීමා නොවී අවශ්‍ය සෑම අවස්ථාවකදීම, සිසුන් යොමුකිරීම වැදගත් වේ. විෂය සමාගමී ක්‍රියාකාරකම්, විෂය බාහිර ක්‍රියාකාරකම් වලදී දරු දැරියන් තුළ විවිධ ක්ෂේත්‍රවලට අයත් නිපුණතා සංවර්ධනය කිරීමට එය මහඟු පිටුවහලක් වනු ඇත. තීරණ ගැනීම, නායකත්වය , සහභාගිත්වය, සංවිධානය, සැලසුම්කරණය, ආදි විවිධ කටයුතු වලදී හැකි ආකාරයෙන් සිසුන්ගේ දායකත්වය ලබාගැනීම සඳහා විශේෂ අවධානයක් යොමුකළ යුතු ය. විශේෂයෙන් පාසල තුළ ක්‍රියාත්මක වන සැගවුන විෂය මාලාව ක්‍රියාත්මක කිරීමේ දී විදුහල්පති තුමා ඇතුළු සියලුම පරිපාලන නායකයින් දරු දැරියන් තුළ ජීවන නිපුණතා සංවර්ධනය කිරීමට උචිත වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීම වැදගත් වේ.

මීට අමතරව විවිධ සමාජ සේවා හා සුභසාධන කටයුතු වල සිසුන් නිරත කරවීම සඳහා පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් නවීකරණය වීම අවශ්‍යය. විශේෂයෙන් ගුරු, දෙමාපිය ප්‍රජා වැඩ සටහන් වලදී සිසු දායකත්වය හා මගපෙන්වීම ලබා ගැනීමට අවශ්‍ය කටයුතු පාසල් ප්‍රතිපත්ති තුළ අන්තර්ගත විය යුතු වේ. එමෙන්ම පාසල තුළ "මගේ හොඳ වැඩපොත" නමින් දිනපොතක් සෑම සිසුවකු ලවාම පවත්වා ගෙන යාමට මගපෙන්වීම කළ හැකි ය. මෙය වරින්වර පරීක්ෂා කිරීම මගින් සිසුන් තුළ උපස්ථම්භන ඇති කිරීම වැදගත් වේ.

විශේෂයෙන් ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපන සංකල්ප ජීවන නිපුණතා ගුරුවරයා මෙන්ම අන් විෂයයන් උගන්වන ගුරුවරුන් මගින් ද සංවර්ධනය කිරීම පාසල් ප්‍රතිපත්ති වලට ඇතුලත් කළ යුතු ය. ඔවුන්ගේ සහය ද ඒ සඳහා ලබා ගැනීම සුදුසු ය. එසේම මෙම විෂය හා සම්බන්ධව සහය ලබාදෙන බාහිර ආයතන හා පුද්ගලයින් ගේ උපරිම දායකත්වයන් ලබා ගැනීම යොමු කළ යුතු ය. පන්ති කාමරයේ දීත්, පන්ති කාමරයෙන් බැහැරව විවිධ අවස්ථාවන්හිදීත් උදා: ක්‍රීඩා පිටිය , පුස්තකාලය, ආපනශාලාව, නේවාසිකාගාරය පොදු ස්ථාන , උදේ රැස්වීම යන පාසැල් විවිධ කාර්යය සංසිද්ධීන්හි දී ශිෂ්‍යයින්ගේ හැසිරීම් රටාවන් තුළින් ජීවන නිපුණතා ප්‍රදර්ශනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම විෂයයේ ඉගෙනුම්ඵල ලෙස පාසලේ විනය ගැටළු අඩුවීම, සිසුන් ප්‍රීතියෙන් ඉගෙනීමේ යෙදෙන තැනක් (පාසල ප්‍රියජනක ස්ථානයක්) ප්‍රියජනක පරිසරයක් නිර්මානය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

පාසල් ප්‍රතිපත්ති සහ වැඩ සටහන් (පුරවැසි අධ්‍යාපනය)

පාසල පවතින්නේ මානව වර්ගයාට සමානාත්මතාවෙන් යුක්ත ව සේවය කිරීමට ය. ලෝක වාසීන් පිළිබඳ අවබෝධය වර්ධනය කිරීමටත් මිනිස් ජීවිතයට හා මිනිස් වර්ගයාට ගෞරව කිරීමටත් උගන්වන්නේ පාසලෙනි. එසේම යහපත් ආකල්පවලින් යුක්ත වූද යහපත් චර්යාවලින් හෙබි පුද්ගලයන් බිහි කිරීම ද පාසල සතු වගකීමක් වෙයි. මානව වර්ගයාට සංවර්ධනය විය හැක්කේ එකමුතුකම හා සාමූහික ප්‍රයත්න තුළින් පමණක් වන අතර ඒ සඳහා පදනම වැටෙන්නේ ද පාසල තුළිනි. එ බැවින් පුරවැසි අධ්‍යාපනය යන විෂයය පාසල්වල අනිවාර්යයෙන් ඉගැන්විය යුතු විෂයයක් වන්නේ ය.

විෂය නිර්දේශයේ අන්තර්ගතය වඩා සාර්ථක ඉගෙනුම් අත්දැකීම් බවට පත් කිරීම සඳහා සෑම ශිෂ්‍යයකුට ම සහභාගි විය හැකි ප්‍රදේශයට ගැලපෙන වාර්ෂික වැඩ සටහනක් සම්පාදනය කිරීම පාසල් අධිකාරීන්ගේ වගකීමකි. වසර ආරම්භයේ දී ප්‍රායෝගික ව ක්‍රියාත්මක කළ හැකි වැඩ සටහනක් සකස් කිරීම ප්‍රයෝජනවත් වේ. එවැනි වැඩසටහනකට ඇතුළත් කළ හැකි විෂය සමගාමී ක්‍රියාකාරකම් කිහිපයක් පහත දැක්වේ.

- ක්ෂේත්‍ර වැඩ සටහන් හා අධ්‍යාපන චාරිකා සංවිධානය කිරීම.
- කුඩා ප්‍රමාණයේ පර්යේෂණ ව්‍යාපෘති ආරම්භ කිරීම.
- දැනුම මිනුම වැඩ සටහන්, විවාද හා ප්‍රදර්ශන පැවැත්වීම.
- බිත්ති පුවත්පත් හා වාර ප්‍රකාශන පළ කිරීම.
- ප්‍රදේශයේ පිහිටුවා ගෙන ඇති වෙනත් සංවිධාන සමග එක් ව කටයුතු කිරීම.
- ජාතික හා ජාත්‍යන්තර සංවිධාන සමග කටයුතු කිරීම.
- සම්පත් පුද්ගලයින්ගේ සහභාගිත්වයෙන් වැඩමුළු පැවැත්වීම.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 7.0 යෝජිත කාලච්ඡේද

| ඒකකය | කාලච්ඡේද සංඛ්‍යාව (ජීවන නිපුණතා) |
|---|---|
| 01 | 08 |
| 02 | 07 |
| 03 | 07 |
| 04 | 08 |
| | 30 |

| ඒකකය | කාලච්ඡේද සංඛ්‍යාව (පුරවැසි අධ්‍යාපනය) |
|---|---|
| 01 | 10 |
| 02 | 10 |
| 03 | 10 |
| | 30 |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 8.1 විෂය නිර්දේශය (ජීවන නිපුණතා) 1 කොටස

**නිපුණතාව**

1.0 ආත්මාවබෝධයෙන් යුතුව ගුණකරුකව කටයුතු කරයි. (කාලච්ඡේද 08)

**නිපුණතා මට්ටම**

1.1 තමා පිළිබඳ තොරතුරුවල අවශ්‍යතාව සහ ඒවායේ වැදගත් තම අධ්‍යයනය කරයි.

විෂය සන්ධාරය (කාලච්ඡේද 03)

- තමා හඳුන්වාදීම
- සැම අයකුම සතු දුබලතා හා ප්‍රබලතා
- දුබලතා හා ප්‍රබලතා විනිශ්චය කිරීම
- අරමුණු හඳුනා ගැනීම හා අරමුණු සාක්ෂාත් කරගැනීමට ප්‍රබලතා බලපාන අයුරු අවබෝධ කර ගැනීම
- ප්‍රබලතා වැඩි දියුණුකර ගැනීමේ හා දුබලතා අවම කිරීමේ වැදගත්කම හා එසේ කළ හැකි අයුරු

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම්**

- සැම ශිෂ්‍යයකු ලවාම තමා කවුරුද යන්න හඳුන්වාදීමට සැලැස්වීම.
- සිසු හැකියා ප්‍රදර්ශනයට අවස්ථා සංවිධානය.
- විනෝදජනක ක්‍රීඩා මගින් ප්‍රබලතා හා දුබලතා හඳුනාගැනීම.

**ගුණාත්මක යෙදවුම්**

- ඩිමයි කොළ, හාෆ් ෂීට්
- ෆෙල්ට් පෑන්
- ෆයිල් කවර
- ගම් ටේප්

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

**නිපුණතා මට්ටම**

1.2 ජීවිතය හා පසුබිම පිළිබඳ තොරතුරු ගවේෂණය කරයි.(කාලච්ඡේද 02)

**<u>විෂය අන්තර්ගතය</u>**

- පවුල පිළිබඳ තොරතුරු
- ජීවත්වන පරිසරය පිළිබඳ තොරතුරු
- ජීවිතයේ අමතක නොවන සිදුවීම්
  - ජීවිතයේ සතුටුදායක අවස්ථා
  - ජීවිතයේ ශෝකජනක අවස්ථා
- ජීවිතයේදී උදව් කළ අය

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම්**

- පවුලේ තොරතුරු නිර්මාණශීලිව ඉදිරිපත් කිරීමට යොමු කිරීම.
- අමතක නොවන සිදුවීම් ඉදිරිපත් කිරීමට අවස්ථාවාදීම.
- තමන්ට උදව් උපකාර කළ අයට කෘතගුණ දැක්වීමට කවි, ගීත, සුභපැතුම්, ඇතුලත් නිර්මාණ කසක් කිරීම සහ උපහාර සංවිධානය.
- තම අනාගත බලාපොරොත්තු හා ඉලක්ක දැක්වෙන නිර්මාණ කිරීමට යොමු කරවීම.

**ගුණාත්මක යෙදවුම්**

- ඩිමයි කොළ
- ෆෙල්ට් පෑන්
- ටේප්, නූල් බෝල
- කතුරු, ගම් බෝතල්
- බ්‍රිස්ටල් බෝඩ්

**නිපුණතා මට්ටම**

1.3 තමාගේ හා අන් අයගේ වටිනාකම් හඳුනාගෙන ඒවාට ගරු කරමින් සහයෝගයෙන් කටයුතු කරයි. (කාලච්ඡේද 02)

**<u>විෂය අන්තර්ගතය</u>**

- තමන් සතු ගුණදහම් හඳුනාගැනීම
- තමන්ට එම ගුණදහම් හුරුවූ ආකාරය
- විවිධ ගුණදහම් වලට ගරුකිරීම

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම්**

- මා සතු හොඳම ගුණාංගය ක්‍රියාකාරකමක් මගින් ඉදිරිපත් කිරීමට අවස්ථාවදීම.
- මා සතු ගුණාංග මට ලැබුණු ආකාරය බුද්ධි කලම්භන සාකච්ඡාවක් මගින් විමසීම.
- විවිධ ආගම්වල හර පද්ධතීන් හා ඒ ඒ ආගමට අදාල සංකේතයක් ප්‍රදර්ශනය කර ඒවාට ගරුකල යුතු ආකාරය කණ්ඩායම් ක්‍රියාකාරකමක් මගින් ක්‍රියාත්මක කිරීම.

**ගුණාත්මක යෙදවුම්**

- ලියන කොළ
- ඩිමයි කොල
- ෆෙල්ට් පෑන්
- ආගමික සංකේත දැක්වෙන රූප
- ගම්, ටේප්

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

**නිපුණතාව**

2.0 මනා සැලසුමකින් හා සංවිධානාත්මකව කටයුතු කරයි. (කාලච්ඡේද 07)

**නිපුණතා මට්ටම**

2.1 ජීවිතයට අදාල කටයුතු මනා සැලසුමකින් හා සංවිධානාත්මකව ඉටු කරයි.
(කාලච්ඡේද 04)

**විෂය අන්තර්ගතය**

- එදිනෙදා කටයුතු සැලසුම් කිරීම හා සංවිධානය.

**යෝජිත ඉගෙනුම් ක්‍රියාකාරකම්**

- භූමිකා රංගන මගින් සැලසුම්කරණයේ හා සංවිධානාත්මක බවේ වටිනාකම් නිරූපණය.

**ගුණාත්මක යෙදවුම්**

- භූමිකාරංගන වලට අදාල ඇඳුම් පැළඳුම්
- විවිධ උපකරණ.

**නිපුණතා මට්ටම**

2.2 ඵලදායි ලෙස විවේකය ගතකරයි. (කාලපරිච්ඡේද 03)

**විෂය අන්තර්ගතය**

- විවේකයේ අරුත හා එහි අවශ්‍යතාව
- ඵලදායි ලෙස විවේකය ගත කිරීමේ උචිත විවිධ ක්‍රම උපක්‍රම

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රමවේද**

- විවේකය ගත කිරීමට කෙටි අවස්ථාවක් ලබාදී ඒ තුළින් තමන්ට ලැබුණු අත්දැකීම් විමසීම.
- සිසුන් කැමති විනෝදාංශ විමසමින් ඒවා වගුවක සටහන් කර ඒවායේ උචිත අනුචිත බව සාකච්ඡා කිරීම.
- විවේකය ඵලදායි ලෙස ගත කිරීමෙන් ලද නිර්මාණ ප්‍රදර්ශනය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

**ගුණාත්මක යෙදවුම්**

- ඩිමයි කොල තුල්, හාෆ්ශීට්
- වර්ණ පින්තූර, මුද්දර
- කාඩ්බෝඩ්
- ෆෙල්ට් පෑන්
- රිජිෆෝම්
- කතුරු
- ගම්බෝතල්

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

**නිපුණතාව**

3 ඵලදායි සන්නිවේදනයේ යෙදෙයි. (කාලච්ඡේද 07)

**නිපුණතා මට්ටම**

3.1 සක්‍රිය සවන්දීම හා නිවරදිව අදහස් ප්‍රකාශ කරීමේ යෙදෙයි. (කාලච්ඡේද 04)

**විෂය අන්තර්ගතය**

- සක්‍රිය සවන්දීම
- මිත්‍රශීලීව කථාබස් කිරීම. (සිත් ඇදගන්නා බව)
- නිරවුල් , නිවැරදිව හා ක්‍රමවත්ව අදහස් ප්‍රකාශ කිරීම.
- අදහස් හුවමාරුවේ දී අදාලත්වය හා කාලය පිළිබඳ සැලකිලිමත් වීම.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම්**

- පන්තියේ සිසුන් දාමයක් ලවා එක් පණිවුඩයක් සම්ප්‍රේෂණය කිරීම. (ආරම්භය හා අවසානය සන්සන්දනය කිරීම)
- උපදෙස් අනුව චිත්‍රයක් /සටහනක් /ඇදිම.
- භූමිකාරංගන මගින් මිත්‍රශීලිව කථාබස් කිරීම.

**ගුණාත්මක යෙදවුම්**

- ඩිමයි කොල
- ෆෙල්ට් පැන්
- කැසට් පටි.
- ගම්ටේප්
- කැසට් රෙකෝඩර්

**නිපුණතා මට්ටම**

3.2 ඵලදායි සන්නිවේදනය මගින් යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා ගොඩනගා ගනියි. (කාලච්ඡේද 03)

**විෂය අන්තර්ගතය**

- අන්තර් පුද්ගල සම්බන්ධතා ගොඩ නගා ගැනීමට ඵලදායි සන්නිවේදනයේ අවශ්‍යතාව
- නරවුල් සන්නිවේදනයක් නොමැති විට පුද්ගලයින් තුළ අනවබෝධය ප්‍රදර්ශනය විම.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

- ඵලදායි සන්නිවේදනය තුළින් සහයෝගය ගොඩ නැගෙන බව හා සංවර්ධනය වන බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම්**

- පැහැදිලි සන්නිවේදනයක් නොමැති වීමෙන් ඇතිවන අවාසිදායක හා අවදානම් තත්ත්ව පිළිබඳ ව ක්‍රීඩා හා ක්‍රියාකාරකම් සැලසුම් කිරීම.
- ඵලදායි සන්නිවේදනය මගින් ඕනෑම කාර්යයක සාර්ථකත්වය ළඟාගත හැකි ආකාරය ක්‍රියාකාරකම් තුළින් සාකච්ඡා කිරීම.

**ගුණාත්මක යෙදවුම්**

- ඩීමයි කොළ
- ෆෙල්ට් පෑන්
- පින්තූර , චිත්‍ර

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

**නිපුණතාව**

4 සහනුභූතියෙන් යුතුව කටයුතු කරයි (සහකම්පනය /අනුවේදනය ) (කාලච්ඡේද 08)

**නිපුණතා මට්ටම**

4.1 අන්‍යයන්ගේ අවශ්‍යතා තමාගේ අවශ්‍යතාවක් ලෙස දැක යහපත් ප්‍රතිචාර දක්වයි.

(කාලච්ඡේද 04)

**විෂය අන්තර්ගතය**

- අන්‍යයන්ගේ අවශ්‍යතා වලට හැඟීම් වලට සංවේදී වීම.
- පාසලෙහි හා පවුල තුළ යම් යම් කාර්යයන් වලදී සංවේදීව කටයුතු කිරීම.
- විශේෂ අවශ්‍යතා ඇති අය සම්බන්ධයෙන් මානව දයාවෙන් කටයුතු කිරීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

- සිද්ධි, අවස්ථා ඇසුරින් සංවේදීවී මේ වැදගත්කම හඳුනා ගැනීම.
- සංවේදී බව ඇතිකර ගැනීමට වර්ධනය කළයුතු ගුණාංග භූමිකා රංගන මගින් ඉදිරිපත් කරවීම.
- සංවේදීතාවය සිසුන් තුළ ප්‍රගුණ කිරීමට ප්‍රායෝගික හා ක්ෂේත්‍රීය කටයුතු වල නිරත කරවීම.

**ගුණාත්මක යෙදවුම්**

- විවිධ සිද්ධි දැක්වෙන වාර්තා, පින්තූර, ඡායාරූප
- රෙජිෆෝම් බෝඩ්
- ඩිමයි කොළ,ෆෙල්ට් පෑන්.

**නිපුණතා මට්ටම**

4.2 පරිසරය, ජාතික හා සංස්කෘතික උරුම සුරැකීමට පෙලෙඹෙයි. (කාලච්ඡේද 03)

**විෂය අන්තර්ගතය**

- පරිසරයට සංවේදී වීම.
- ජාතික හා සංස්කෘතික උරුම අභිමානයෙන් යුතුව සුරකියි.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම්**

- සංවේදී විය යුතු පරිසර ගැටළු හඳුනාගෙන ඒවා අවම කිරීමට දායක වීමට වැඩ සටහන් සැලසුම් කිරීම.
- ජාතික හා සංස්කෘතික උරුම කෙරෙහි සංවේදීවීමේ වැදගත්කම දැක්වෙන විවිධ ක්‍රියාකාරකම් සංවිධානය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ගුණාත්මක යෙදවුම්

- පරිසරය නිරීක්ෂණයට සහභාගිවීම.
- තොරතුරු , ස්ථාන, සටහන් කර ගැනීම අවශ්‍ය කේෂ්ත්‍ර පොත්
- ජාතික උරුම හා සංස්කෘතික උරුම දැක්වෙන ඡායාරූප, විස්තර, වාර්තා
- ඩිමයි කොළ,
- ෆෙල්ට් පෑන්

**නිපුණතා මට්ටම**

4.3 අධි සංවේදී නොවී කාර්යයන්හි නිරත වෙයි. (කාලච්ඡේද 01)

**විෂය අන්තර්ගතය**

- අධි සංවේදී නොවී කාර්යයන්හි නිතරවීම.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම්**

- අධි සංවේදී වී මෙන් තම කටයුතු වලට බාධාවන ආකාරය විවිධ සිද්ධි,කථා ඇසුරින් සාකච්ඡා කිරීම.

**ගුණාත්මක යෙදවුම්**

- අධි සංවේදී වී මෙන් සිදුවූ හානි දැක්වෙන පුවත්පත් වාර්තා, කථා, පිංතූර, චිත්‍ර
- ලියන කඩදාසි
- කතුරු , ගම්
- ඩිමයි කොළ

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 6.2 පුරවැසි අධ්‍යාපනය II කොටස

# <u>අපේ පාසල</u>

**නිපුණතාව**

ක්‍රියාශීලී සමාජිකයකු වශයෙන් පාසල් සමාජයේ සංවර්ධනයට දායක වේ.

**නිපුණතා මට්ටම්**

- පාසල් සමාජයේ සාමාජිකයෙක් ලෙස තම වගකීම් හා යුතුකම් ඉටු කරයි.
- පාසල් සංස්කෘතිය තුළ පාසලේ පවත්නා නීතිරීති හා සම්ප්‍රදායන්ට අනුගත වේ.

**විෂය අන්තර්ගතය**

6.1 අපේ පාසල (කාලච්ඡේද 10)

6.1.1 පාසලේ ආරම්භය හා විකාශය.

6.1.2 සංවිධාන ව්‍යුහය

6.1.3 පාසල් සමාජය

6.1.4 පාසල් සංස්කෘතිය

6.1.5 පාසලේ අනන්‍යතාව

- ★ පාසල් ගීය, පාසල් කොඩිය, පාසල් නිල ඇඳුම, පාසල් ලාංඡනය, ආදර්ශ පාඨය.
- ★ සම්ප්‍රදායන්
- ★ නීතිරීති

6.1.6 පාසල් සාමාජිකයන්ගේ වගකීම් හා යුතුකම්

6.1.7 පාසලෙන් සිදුවන සේවය

6.1.8 පාසල හා සමාජය අතර සබඳතා

**යෝජිත ඉගෙනුම් ක්‍රියාකාරකම්**

1. පාසලේ ආරම්භය හා විකාශය පිළිබඳ වාර්තාවක් සකස් කිරීම.
2. පාසලේ දීප්තිමත් ආදී ශිෂ්‍යයන් පිළිබඳ තොරතුරු රැස්කිරීම.
3. පාසලේ සිසුන් වශයෙන් පිළිපැදිය යුතු නීතිරීති හා සම්ප්‍රදායන් වෙන වෙනම ලේඛනගත කොට පන්ති කාමරයේ ප්‍රදර්ශණය කිරීම.
4. පාසලේ සංවිධාන ව්‍යුහය දැක්වෙන චාට් සටහන් සකස් කිරීම.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

**ගුණාත්මක යෙදවුම්**

- ප්‍රදේශයේ සිතියම/ පාසල පිළිබඳ තොරතුරු ඇතුළත්
- සඟරා , පොත්පත්, ලිපි/ පාසල් කොඩි / ලාංඡනය
- පාසල් ගීය/ පාසල් පිළිබඳ තොරතුරු දන්නා පුද්ගලයන්

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

# <u>අප ජීවත් වන ප්‍රදේශය</u>

**නිපුණතාව**

ප්‍රදේශයේ මානව හා භෞතික සම්පත් සමාජයේ යහපැවැත්මට දායක කර ගනියි.

**නිපුණතා මට්ටම්**

- තමා ජීවත්වන ප්‍රදේශයේ සම්පත් අගය කරමින් ඒවා සංරක්ෂණය කිරීමට කටයුතු කරයි.
- ප්‍රදේශවාසීන් සමඟ සාමූහිකත්වයෙන් ජීවත්වීමට සූදානම ප්‍රදර්ශනය කරයි.
- විවිධ පුද්ගලයින් හා ආයතන තම දෛනික දිවි පැවැත්මටඅවශ්‍ය බව තේරුම් ගෙන කටයුතු කරයි.

**විෂය අන්තර්ගතය**

6.2 අප ජීවත්වන ප්‍රදේශ (කාලච්ඡේද 10)

6.1.9 පිහිටීම
- ග්‍රාම නිලධාරි කොට්ඨාශය
- දිස්ත්‍රික්කය
- පළාත

6.1.10 අප ප්‍රදේශයේ සම්පත්
- භෞතික සම්පත්
- මානව සම්පත්

6.1.11 ප්‍රදේශයේ ආර්ථික කටයුතු

6.1.12 ප්‍රදේශ වාසීන් තුළ සාමූහිකත්වය කැපී පෙනෙන අවස්ථා

6.1.13 ප්‍රදේශයේ සිද්ධස්ථාන, සමිති සමාගම්, ආයතන හා මගින් ඉටුවන සේවා

6.1.14 අපට උදව් කරන හෝ පුද්ගලයන් හා සංවිධාන ග්‍රාම නිලධාරි, සමෘද්ධි නිලධාරි, පවුල් සෞඛ්‍ය නිලධාරිනි, මහජන සෞඛ්‍ය පරීක්ෂක, තැපැල්කරු, පොලිස් නිලධාරීන්, ස්වේච්ඡා සංවිධාන

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

**යෝජිත ඉගෙනුම් ක්‍රියාකාරකම්**

- පළාත් හා දිස්ත්‍රික්ක වෙන් කරන ලද සිතියමක තම ප්‍රදේශයේ දළ පිහිටීම සේයාකර දැක්වීම.
- අප ජීවත්වන ප්‍රදේශයේ අවට පරිසරය හඳුනා ගැනීම සඳහා ක්ෂේත්‍ර චාරිකාවක නිරත වී තොරතුරු රැස්කිරීම.
- ප්‍රදේශයේ සාමූහිකත්වයෙන් වැඩ කරන අවස්ථාවකට සහභාගී වීම.
- සමාජ ජීවිතයේ අපට උදව් වන්නන් පිළිබඳ භූමිකා රංගනයක් ඉදිරිපත් කිරීම.
- ප්‍රදේශයේ විවිධ නිෂ්පාදන හා ඒආශ්‍රිත රැකියා ලැයිස්තු ගත කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- දිස්ත්‍රික් හා පළාත් දක්වන සිතියම.
- සාමූහිකත්වයෙන් වැඩ කරන අවස්ථා දක්වන පින්තූර
- සම්පත් පුද්ගලයන් , බ්‍රිස්ටල් බෝඩ්, ඩිමයි කොළ
- ෆෙල්ට් පෑන්, ඩෝවින් පින්ස්.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

# යහපත් පුරවැසියකු වශයෙන් ප්‍රගුණ කළ යුතු ගුණාංග

(කාලච්ඡේද 10)

**නිපුණතාව**

- යහපත් ගුණාංග වලින් හෙබි සාමාජිකයකු ලෙස ජන සමාජය තුළ කටයුතු කිරීමට සූදානම ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම්**

- යහපත් පුරවැසියකු වශයෙන් සමාජයේ ජීවත්වීමට අවශ්‍ය ගුණාංග ප්‍රගුණ කරයි.

**විෂය අන්තර්ගතය**

6.3 යහපත් පුරවැසියකු වශයෙන් ප්‍රගුණ කළ යුතු ගුණාංග

6.1.15 පරිසර සංරක්ෂණය

6.1.16 පොදු දේපල සුරැකීම.

6.1.17 දේශීය දේ අගය කිරීම.

6.1.18 ආචාරශීලී භාෂා භාවිතය

6.1.19 සම්පත් අරපිරිමැස්මෙන් යුතුව භාවිතය

6.1.20 විනය හා ශික්ෂණය

6.1.21 අන්මත ඉවසීම හා සාකච්ඡා මගින් නිවැරදි තීරණවලට එළඹීම.

6.1.22 සමාජයේ සරු දේ සරු ලෙස පිළිගැනීම හා නිසරු දේනිසරු ලෙස පිළිගෙන ප්‍රතික්ෂේප කිරීම.

6.1.23 සමාජ සම්ප්‍රදායන් හා නිතිරීති ගරු කිරීම.

**යෝජිත ඉගෙනුම් ක්‍රියාකාරකම්**

- ආචාරශීලීව සන්නිවේදන නිපුණතාවන් ප්‍රදර්ශනය වීම පිණිස සම්මුඛ සාකච්ඡා මෙහෙයවීම.
- පරිසර සංරක්ෂණයට අදාල ක්‍රියාකාරකම් වල සිසුන් නිරත කරවීම. උදා: පාංශු ඛාදනය වැළැක්වීම.
- පොලිතින් භාවිතය අවම කිරීම, පැළ රෝපණය කිරීම.
- පරිසරය ආරක්ෂාව පිළිබඳ ආදර්ශ පාඨ පාසල් ප්‍රදර්ශනය කිරීම.
- පාසලේ කැඩී බිඳී ගිය ඩෙස්පුටු වැනි පාසල් උපකරණ පිළිබඳව සංගණනයක් පවත්වා ඒවා විනාශවීමට හේතු හා ඒවා වළක්වා ගැනීමට ගතහැකි ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාවක් සකස් කිරීම.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

**ගුණාත්මක යෙදවුම්**

- සම්පත් පුද්ගලයින්
- ලියන ලද ආදර්ශ පාඨ
- විවිධ පැළ වර්ග
- බ්‍රිස්ටල් බෝඩ්

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.